මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2021 ඔක්තෝබර් මස 14 දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 07-2021 ඔක්තෝබර්

# ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වාගනී

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2021 ඔක්තෝබර් මස 13 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 5.00 සහ සියයට 6.00 ලෙස දැනට පවතින මට්ටමේ පවත්වාගෙන යෑමට තීරණය කළේය. දේශීය සහ ගෝලීය වශයෙන් වන සාර්ව ආර්ථික තත්ත්වයන් සහ අපේක්ෂිත වර්ධනයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් මණ්ඩලය මෙම තීරණයට එළඹුණි. ඉදිරි කාලය තුළදී ආර්ථිකයට එහි විභව මට්ටම කරා ළඟාවීම සඳහා සහාය වන අතරම සුදුසු ක්‍රියාමාර්ග මගින් මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීම සඳහා වන සිය කැපවීම මුදල් මණ්ඩලය නැවත අවධාරණය කරන ලදී.

## ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් පවතී

රටවල්වල ආර්ථික වර්ධන වේගයේ විශාල අසමානතාවන් පැවතියත්, ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 ඔක්තෝබර් මස 12 වැනි දින නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ගෝලීය ආර්ථිකය 2021 වසරේදී සියයට 5.9කින් සහ 2022 වසරේදී සියයට 4.9කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 එන්නත් ලබා ගැනීම සහ ප්‍රතිපත්තිමය සහායයන්හි පවතින අසමානතා හේතුවෙන් රටවල් අතර ආර්ථික අපේක්ෂා එකිනෙකට වෙනස්ව පවතී. වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ සැපයුම් හා ඉල්ලුම් නොගැළපීම් සහ පෙර වසරේ පැවති අඩු මිල මට්ටම්වලට සාපේක්ෂව වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් බොහෝ රටවල පාරිභෝගික මිල උද්ධමනය සැලකියයුතු ලෙස ඉහළ ගොස් තිබේ.

## වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවන බාධා මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙමින් තිබේ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු අනුව, 2021 වසරේ පළමු කාර්තුව තුළදී වාර්තා වූ සියයට 4.3ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයෙන් අනතුරුව ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ දෙවන කාර්තුව තුළදී සියයට 12.3ක වාර්ෂික ලක්ෂ්‍යමය මූර්ත වර්ධනයක් වාර්තා කරමින් වේගයෙන් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කළේය. කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා ඉවත් කිරීමෙන් පසු ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග කොවිඩ්-19 එන්නත් කිරීමේ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා සහාය වන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරි කාලය තුළදී ආර්ථික ක්‍රියාකාරීත්වය තිරසාරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවත්නා දර්ශක සහ පුරෝකථනවලට අනුව 2021 වසර තුළදී මූර්ත ආර්ථිකය සියයට 5කින් පමණ වර්ධනය වනු ඇති අතර, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරමින් පවතින නුදුරු කාලීන ස්ථායීකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් මැදි කාලීනව ඉහළ සහ තිරසාර වර්ධන මාවතකට ආර්ථිකය ක්‍රමයෙන් ගමන් කරනු ඇත.

## රජය සහ මහ බැංකුව සැලසුම් කළ ඒකාබද්ධ ක්‍රියාමාර්ග මගින් ඉදිරි කාලය තුළදී විදේශීය අංශය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ

අපනයන ආදායම සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර 2021 වසරේ අගෝස්තු මාසයේදී අඛණ්ඩව තුන්වන මාසයටත් එ.ජ. ඩොලර් බිලියනයකට වැඩි අපනයන ආදායමක් වාර්තා කළේය. ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑමේ බලපෑමද පිළිබිඹු කරමින් ආනයන වියදම ද ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ වෙළඳ හිඟය පුළුල් විය. ගෝලීය වශයෙන් සංචරණ සීමා ලිහිල් කිරීම සහ රට තුළ එන්නත්කරණ ක්‍රියාවලිය සාර්ථකව සිදු කිරීම හේතුවෙන් සංචාරක ව්‍යාපාරය පිළිබඳ ඉදිරි අපේක්ෂා වැඩි දියුණු විය. මෑත මාසවලදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් මන්දගාමී වුවද, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා විදේශ රැකියා උත්පාදනය කෙරෙන ප්‍රධාන රටවල ඉදිරි වර්ධන අපේක්ෂා වැඩි දියුණු වීම සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වඩාත් ස්ථාවර වීම මගින් ඉදිරි කාලය තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් යථා තත්ත්වයට පත් වීමක් අපේක්ෂා කෙරේ.

ආර්ථිකයට විදේශ ආයෝජන ළඟා කර ගැනීම සහ *'සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම'* තුළින් දක්වා ඇති පරිදි මහ බැංකුව විසින් කාලෝචිත පිළියම් යෙදීම මගින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ඇති පීඩනය ක්‍රමයෙන් ලිහිල් වෙමින් පවතී. තවද, ඉන්ධන ඇතුළු අත්‍යවශ්‍ය ආනයන සඳහා මුදල් ලබා දීමට විදේශ විනිමය වෙළඳපොළ තුළට මහ බැංකුව අඛණ්ඩව මැදිහත් විය. 2021 වසරේ මේ දක්වා කාලය තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සියයට 6.8ක් ලෙස වාර්තා විය. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක මගින් පිළිබිඹු වන පරිදි ශ්‍රී ලංකා රුපියල මේ වන විට සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වී ඇත. මේ අතර, 2021 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.6ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, මෙම සංචිත ප්‍රමාණය තුළ චීන යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන) අගයකින් යුතු චීන මහජන බැංකුව සමඟ ඇති කරගත් ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ. *සය මාසික පෙර දැක්මෙහි* දක්වා ඇති පරිදි නව විදේශ විනිමය ලැබීම් ආකර්ෂණය කරගැනීම සඳහා රජය සහ මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් දළ නිල සංචිත ප්‍රමාණය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් ඉදිරි කාලය තුළදී විදේශීය අංශයේ ස්ථායීතාව ශක්තිමත් කෙරේ.

## දැඩි මුදල් සහ ද්‍රවශීලතා තත්ත්ව හේතුවෙන් වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගිය අතර ණය සහ මුදල් ප්‍රසාරණය අඛණ්ඩව ඉහළ මට්ටමක පවතී

2021 වසරේ අගෝස්තු මාසයේදී සිදු කරන ලද මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට ප්‍රතිචාර වශයෙන්, බොහෝ වෙළෙඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික ඉහළ ගොස් ඇත. තවද, ප්‍රාථමික වෙන්දේසියේදී ලංසු පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතික ඉවත් කිරීමත් සමග රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත. වෙළෙඳපොළ පොලී අනුපාතික මෙලෙස ඉහළ යෑමෙන් අනතුරුව ඉදිරි කාලය තුළදී පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ස්ථාවරවනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඩු පොලී අනුපාතික වාතාවරණය මධ්‍යයේ ණය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම පිළිඹිබු කරමින්, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළදී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය අපේක්ෂිත ලෙස ඉහළ ගියේය. ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ ආර්ථිකයේ ඵලදායී හා අවශ්‍යතා ඇති අංශ වෙත ණය සැපයීම සඳහා ගනු ලබන

ප්‍රයත්න සමග වසරේ ඉදිරි කාලය තුළදී ද ණය ප්‍රසාරණයවීම අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර,රාජ්‍ය අංශය විසින් බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය ද, විශේෂයෙන්ම රජය විසින් ලබාගත් ශුද්ධ ණය, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඉහළ දේශීය ණය ප්‍රසාරණයත් සමග පුළුල් මුදල් ($M_{2b}$) සැපයුමේ වර්ධනය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතිණි.

## ගෝලීය වශයෙන් ඉහළ යමින් පවතින මිල ගණන් හේතුවෙන් උද්ධමන පීඩන දක්නට ලැබේ

ඉහළ මට්ටමක පවතින ආහාර උද්ධමනය සහ ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය යම් ඉහළ යෑමක් වාර්තා වීම හේතුවෙන් මෑත මාස කිහිපය තුළ උද්ධමනය ඉහළ ගියේය. ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම හේතුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක උපරිම සිල්ලර මිල ඉවත් කිරීමට රජයට සිදුවිණි. මෙම හේතුව සහ මෙමගින් ඇතිවන සෙසු වෙළෙඳපොළ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් නුදුරු කාලීනව මතුපිට උද්ධමනය අපේක්ෂිත මට්ටම් වලින් තරමක් වෙනස් විය හැකිය. එවැනි නුදුරු කාලීන සැපයුම් අංශයේ ප්‍රවණතා මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට බලනොපාන අතර, පොලී අනුපාතික සහ වෙළෙඳපොළ ද්‍රවශීලතාව සම්බන්ධයෙන් මහ බැංකුව විසින් දැනටමත් ගෙන ඇති පියවර මැදි කාලීන ඉල්ලුම් පීඩනයන්හි බලපෑම අවම කිරීමට උපකාරී වනු ඇත.

## ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනෙයි

ඉහත සඳහන් කළ පරිදි පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට යෝග්‍ය මට්ටමක පවත්නා බව මුදල් මණ්ඩලයේ අදහස විය. මහ බැංකුව විසින් දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා අඛණ්ඩව නිරීක්ෂණය කරනු ඇති අතර ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම තිරසාරව පවත්වා ගනිමින් සහ ඒ සඳහා සහාය දක්වමින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මැදි කාලීනව අපේක්ෂිත පරාසයෙහි උද්ධමනය පවත්වා ගැනීමේ අරමුණ ඇතිව අවශ්‍ය අවස්ථාවන්හිදී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සූදානමින් සිටියි.

**මුදල් ප්‍රතිපත්ති තීරණය : ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී.**

| | |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 6.00 |
| බැංකු අනුපාතිකය | සියයට 9.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 4.00 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් 2021 ඔක්තෝබර් මස 14 වැනි දින පෙ.ව. 11.00ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වෙන අතර එය ෆේස්බුක් සහ යූ ටියුබ් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2021 නොවැම්බර් මස 25 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | | | | | 2021 | | |
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | පළමු අර්ධය |
| කෘෂිකාර්මික | -6.5 | -8.2 | 3.1 | 1.3 | **-2.4** | 6.1 | 8.1 | **7.1** |
| කාර්මික | -7.9 | -23.1 | 0.6 | 1.3 | **-6.9** | 5.5 | 22.1 | **12.1** |
| සේවා | 2.9 | -12.9 | 2.1 | 1.9 | **-1.5** | 3.0 | 7.5 | **5.1** |
| ද.දේ.නි | **-1.8** | **-16.4** | **1.3** | **1.3** | **-3.6** | **4.3** | **12.3** | **8.0** |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: උද්ධමනය

| මාසය | | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 | ජූලි 21 | අගෝ 21 | සැප් 21 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 3.3 | 4.1 | 3.9 | 4.5 | 5.2 | 5.7 | 6.0 | 5.7 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.2 | 5.1 | 5.5 | 6.1 | 6.1 | 6.8 | 6.7 | - |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 2.6 | 3.1 | 3.0 | 3.2 | 3.2 | 3.7 | 4.1 | 5.0 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.1 | 4.3 | 4.1 | 4.2 | 4.1 | 4.4 | 4.7 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 03: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙසැ 20 | ජන 21 | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 | ජූලි 21 | අගෝ 21 |
| සංචිත මුදල් | 964 | 976 | 978 | 1,029 | 1,031 | 1,036 | 1,065 | 1,064 | 1,089 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 9,406 | 9,533 | 9,651 | 9,839 | 9,947 | 10,033 | 10,165 | 10,304 | 10,514 |
| ශුද්ධ විදේශීය වත්කම් | (209) | (321) | (386) | (430) | (431) | (429) | (481) | (699) | (701) |
| ශුද්ධ දේශීය වත්කම් | 9,615 | 9,854 | 10,037 | 10,269 | 10,378 | 10,462 | 10,646 | 11,003 | 11,215 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 4,548 | 4,758 | 4,793 | 5,005 | 4,965 | 5,024 | 5,195 | 5,513 | 5,682 |
| රාජ්‍ය සංස්ථා සඳහා ලබා දුන් ණය | 1,002 | 1,058 | 1,080 | 1,098 | 1,093 | 1,113 | 1,132 | 1,141 | 1,137 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,171 | 6,197 | 6,276 | 6,388 | 6,446 | 6,501 | 6,585 | 6,661 | 6,796 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 11,462 | 11,643 | 11,790 | 12,010 | 12,154 | 12,265 | 12,402 | 12,563 | 12,790 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2021 අප්‍රේ අවසානයට | 2021 මැයි අවසානයට | 2021 ජූනි අවසානයට | 2021 ජූලි අවසානයට | 2021 අගෝ අවසානයට | 2021 සැප් අවසානයට | 2021 ඔක් 13 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 4.50 | 4.50 | 4.50 | 4.50 | 5.00 | 5.00 | 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 5.50 | 5.50 | 5.50 | 5.50 | 6.00 | 6.00 | 6.00 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 4.64 | 4.66 | 4.93 | 5.10 | 5.79 | 5.94 | 5.92 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 5.11 | 5.13 | 5.18 | 5.22 | 5.87 | 6.70 | 8.04 |
| දින 182 | 5.14 | 5.14 | 5.19 | 5.23 | 5.90 | 6.99 | 7.20(අ) |
| දින 364 | 5.18 | 5.18 | 5.23 | 5.25 | 5.93 | 7.01 | 7.28(අ) |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 5.86 | 5.65 | 5.51 | 5.76 | 6.01 | 6.42 | 6.71(ආ) |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 9.73 | 9.64 | 9.50 | 9.45 | 9.38 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 7.95 | 7.74 | 7.47 | 8.09 | 8.04 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 5.07 | 4.97 | 4.87 | 4.77 | 4.75 | 4.75 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 6.09 | 5.94 | 5.82 | 5.67 | 5.62 | 5.64 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 4.77 | 4.77 | 4.98 | 4.99 | 5.19 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 4.92 | 4.90 | 5.10 | 5.15 | 5.35 | - | - |

(අ) 2021 වසරේ ඔක්තෝබර් මස 06 වන දින පැවති වෙන්දේසියේ එලදා අනුපාතිකය

(ආ) 2021 වසරේ ඔක්තෝබර් මස 08 වන දිනෙන් අවසන් වන සතිය සඳහා

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*